# මුලතිව් සෝදිසි මෙහෙයුමකින් කොටි ගුවන් යානා කොටස් හමුවේ

මුලතිව්, වඩ්ඩකච්චි ප්‍රදේශයේදී ආරක්ෂක අංශ විසින් අද (පෙබ 18) වන දින සිදුකරනු ලැබූ සෝදිසි මෙහෙයුමකදී එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ට අයත් ගුවන් යානා කොටස් කිහිපයක් සොයාගැනීමට සමත්වී තිබේ. මෙසේ හමුවූ ගුවන් යානා අමතර කොටස් පලායන එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් විසින් ගිණිතබා විනාශයට පත්කොට ඇත.

ගුවන් යානායේ සැකිල්ල සහ ගුවන් යානායට අයත් භ්‍රමණය වන කොටස් සහ පිලිස්සීගිය තවත් අමතර කොටස් කිහිපයක් මේ අතර තිබී හමුවූ බව යුද බිමෙන් ලැබුන ආරක්ෂක ආරංචි මාර්ග සදහන් කරයි. එම ස්ථානයේ තිබී හමුවූ ගුවන් යානා සම්බන්ධ අත්පොත් සහ ඒවා ක්‍රියාකරනු ලබන ආකරය ඇතුලත් රූපසටහන් තුලින් ඒල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් ගුවන් යානා පිළිබද විශේෂ අත්හදා බැලීම් සහ පුහුණුවීම් මෙම ප්‍රදේශය තුල සිදුකර ඇතිබව පැහැදිලි වේ.

මීට අමතරව මෙම ප්‍රදේශයේ තිබි ලියවන පට්ටලයක්, අලුමිණියම් තහඩු, මෝටර් එන්ජින් කොටස්, ඇණ මුරිච්චි සහ තවත් ඊට සමාන උපකරණ තොගයක් හට පිරිස් විසින් සොයාගෙන ඇති බව ආර්කෂක අංශ වාර්ථා වැඩිදුරටත් සදහන් කරයි.